News Bulletin

Lanka Microfinance Practitioners' Association

# ලංකා ක්ෂුද්‍රමූල්‍ය වෘත්තිකයන්ගේ සංගමය

LMFPA පුවත් ප්‍රකාශනය 2013 සැප්තැම්බර්

## සමාජ කාර්යයසාධන කළමණාකරණය සඳහා වන විශ්ව සම්මුතීන්

4 වන කොටස:

### සේවාලාභීන්ගේ අවශ්‍යතාවයන් සහ කැමැත්ත පරිදි නිෂ්පාදන සහ සේවාවන්,බෙදාහැරීම් මාධ්‍යයන් සහ ආකෘතීන් නිර්මාණය කිරීම

a) විවිධ ආකාරයේ සේවාලාභීන්ගේ රුචිකත්වයන් සහ අවශ්‍යතාවයන් ආයතනය තේරුම් ගනු ලබයි

1- සේවාලාභීන්ගේ ලක්ෂණ මගින් ඔවුන් නිෂ්පාදන හා සේවාවන් භාවිතා කරන්නේ කෙසේද යන්න තේරුම් ගනු ලබයි. (උදා: ස්ත්‍රී සහ පුරුෂ, ආදායම් මට්ටම, ව්‍යාපාරයේ ස්වභාවය)

2- සේවාලාභීන්ගේ තෘප්තිමත්භාවය තේරුම් ගැනීම (උදා: සමස්ථ අත්දැකීම් සහ වටිනාකම ලබා ගැනීමට ලඟාවීමේ පහසුව, නිෂ්පාදන දියුණු කිරීම සඳහා අදහස්)

3- සේවාලාභීන් ආරක්ෂා කිරීමේ අනුපාතය අධීක්ෂණය සහ සේවාලාභීන් ආයතනය හැරයෑමට හේතුන් තේරුම් ගැනීම

b) ආයතනය විසින් සේවාලාභීන්ට හිරිහැර නොවන පරිදි නිෂ්පාදන, සේවාවන් සහ බෙදාහැරීමේ මාධ්‍යයක් නිර්මාණය කරයි.

1- විවිධ ව්‍යාපාර සහ පවුලේ අවශ්‍යතා සඳහා ලබාගත හැකි විවිධ ණය හෝ නම්‍යශීලී ණය නිෂ්පාදිත ආයතනය මගින් ලබා දෙයි.

2- ණය ලබාගන්නාට ආදායම ලැබේයැයි සිතන පිළිවෙල අනුව ණය ආපසු ගෙවීමේ වැඩසටහන සකස්වී ඇත.

3- මූල්‍ය අවශ්‍යතාවය සහ ව්‍යාපාරයේ වර්ගයට ණය මුදල ගැලපේ

4- නිෂ්පාදනය සේවාලාභීන්ට දැරිය හැකිය. එනම් ඔවුන්ගේ මූල්‍ය නිෂ්පාදන සඳහා ගෙවීමට ඔවුන්ගේ ජීවන තත්වයේ හෝ ව්‍යාපාරයේ වෙනස්කමක් සිදුකරගනිමින් සැලකිය යුතු කැපකිරීමක් කිරීමට සිදු නොවේ. ලබා ගැනීමට ඇති හැකියාව ගැන සලකා බැලීමේදී පහත කරුණු සැලකිල්ලට ගනු ලැබේ. 1) පොලී අනුපාතය, වාරික හා අනෙකුත් සියලුම අයකිරීම් 2) ණය මුදලේ ප්‍රමාණය (හෝ රක්ෂණ වාරිකය) සහ 3 ) වාරික ලෙස් ගෙවීමට අවශ්‍ය වන ප්‍රමාණය.

5- නිෂ්පාදන හා සේවා ලබාදීම සේවාලාභියාට පහසුවන ලෙසද, විශ්වාසවන්තවද සිදු කරයි. (උදා: සේවාලභීන්ගේ නිවස හෝ ව්‍යාපාරයට අසල සේවා මධ්‍යස්ථානය පිහිටා තිබීම) සහ නිෂ්පාදනය හෝ සේවා ලබාගැනීම ස!දහා දැරිය යුතු පෞද්ගලික වියදම අඩු කරයි (උදා: ප්‍රවාහන)

6- නිෂ්පාදනය තේරුම් ගැනීමට සහ සන්සන්දනය කිරීමට එහි නියමයන් හා කොන්දේසි පහසුවෙන් දක්වා ඇත.

7- නිෂ්පාදනයේ වෙනස්කම් ඉතා අවම / නොමැති තරම්ය. ( මිල, කාලය, කොන්දේසි)

8- සේවාලාභීන්ගේ මූලික අයිතිවාසිකම් අතහැර දැමීමට ආයතනය විසින් ඉල්ලා නොසිටිනු ඇත. (උදා: සේවා ලබාදෙන්නාට විරුද්ධව නඩු පැවරීම, තොරතුරු ලබාගැනීම, නිෂ්පාදනය භාවිතය නවතා දැමීම, පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම)

ආයතනය තුල ණය ප්‍රතිපත්ති 2 ක් පිහිටුවා ඇත. 1) ණය ලබාගන්නාගේ මූලික යැපීමේ හැකියාව උදුරාගනු ලබන සුරැකුම් විස්තර කරන සහ ඇපකරුවන්ගේ වගකීම් පිළිබඳ විස්තරයක් ද ඇතුලත් ප්‍රතිපත්තීන්ද, යම් අවස්ථාවක වත්කම් බලෙන් අත්පත් කරගැනීමක් සිදුවුවහොත් එයට සාධාරණ මිලක් ලබාදෙන බවට තහවුරු කරන ප්‍රතිපත්තීන්ද 2) යම් අවස්ථාවකදී ණය ලබාගන්නෙකුට ණය ගෙවීමට හැකියාවක් නොමැතිවුවහොත්, නමුත් ඔහු ණය ගෙවීමට “කැමැත්තක්” දක්වයි නම් එවැනි සේවාලාභීන් සඳහා විශේෂ නැඹුරුවකින් යුතුව ණය නැවත සැලසුම් කර දීම හෝ ණය කපා හැරීම සඳහා ක්‍රියාකාරී විසඳුම් අයත් ප්‍රතිපත්ති

c) ආයතනයේ නිෂ්පාදන, සේවාවන් සහ බෙදාහැරීමේ මාධ්‍යයන් සේවාලාභීන්ට ප්‍රතිලාභ ලබාදෙන ආකාරයට ආයතනයේ සමාජීයය අරමුණු වලට අනුව නිර්මාණය කරනු ලබයි. සේවාලාභීන්ගේ අවශ්‍යතා සහ කැමැත්ත, සේවාවන් සහ නිෂ්පාදනද, සේවාලාභීන්ට ප්‍රතිලාභ ලබාදෙන බවද, බෙදාහැරීමේ ආකෘති සහ මාධ්‍යයන්ද නිර්මාණය කිරීමට සහ වැඩිදියුණු කිරීමටත් පහත කරුණු ඇතුළුව යොදා ගනී.

1- මූල්‍ය අන්තර්ග්‍රහණය සඳහා ඉලක්ක ගත සේවාලාභීන් මුහුණ පාන බාධාවන් අඩු කිරීම (උදා: නොසලකා හැර ඇති ප්‍රජාවට සේවාවන් ලබා ගැනීම සඳහා සේවා මධ්‍යස්ථාන ඇති කිරීම : දුප්පත් ප්‍රජාවට සුදුසු නිෂ්පාදනය ඉදිරිපත් කිරීම)

2- සේවාලාභීන්ගේ අවදානම අඩුකිරීමට සහ නිතර ඇතිවන හදිසි අවස්ථාවලදී මුහුණ දීමට ප්‍රමාණවත් මුදල් හා සේවාවන් සේවාලාභීන්ට අවශ්‍ය අවස්ථාවලදී ලබා දීම. (උදා: ඉතිරිකිරීම්, රක්ෂණය, ආපදා ණය, ව්‍යාපාර සහයෝගිතා සේවාවන්)

3- ආර්ථිකයේ වාසිදායක තත්වයන් වලදී සේවාලාභීන්ට ආයෝජනය කිරීමට ඉඩ ලබා දීම මගින් ඔවුන්ට අනිකුත් ප්‍රතිලාභ ඇති කිරීම. (උදා: ණය සඳහා/යන්ත්‍රසූත්‍ර ලිසිං කිරීම) සහ අවශ්‍යවන ගෘහස්ත අවශ්‍යතාවයන් (උදා: නිවාස අළුත්වැඩියා ණය, විවාහ මංගල්‍ය සඳහා ඉතිරිකිරීම)

4- ආයතනයේ මෙහෙයුම් නිෂ්පාදන සහ සන්නිවේදනය දියුණු කිරීම සඳහා පැමිණිලි මගින් ලැබෙන තොරතුරු යොදා ගනී.

## “පොහොසත් පවුල” පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන

LMFPA ආයතනය හා Plan Sri Lanka ආයතනය එක්ව සංවිධානය කළ පොහොසත් පවුල, වැඩසටහනේ දෙවන අදියර 2013 සැප්තැම්බර් 02 සිට 06 වන දින දක්වා කොළඹදී පැවැත්විය. සාමාජික ආයතන 11 ක් නියෝජනය කරමින් 26 දෙනෙක් මේ වැඩසටහන සඳහා සහභාගි විය. පළමු අදියර ලෙස 2013 මැයි මසදී පැවැත්වු පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහනට සහභාගිවුවන් කිහිප දෙනෙකු මෙවර සම්පත්දායකයින් ලෙස සහභාගී විය. සහභාගිවුවන්ගෙන් වැඩසටහන පිළිබඳ යහපත් ප්‍රතිචාර ලබා ගැනීමට LMFPA වෙත හැකියාව ලැබින. මීළඟ වැඩසටහන රත්නපුර හා මාතර නගරයේදී පැවැත්වේ.










*******************************

**මෙම ප්‍රකාශනයේ දැන්වීම් පල කිරීම සඳහා අමතන්න.**

කළමණාකරු
ලංකා ක්ෂුද්‍රමූල්‍ය වෘත්තිකයන්ගේ සංගමය
112 A, මද්දුමගේවත්ත,
නුගේගොඩ.
දුක: +94 11 4367621, 4369612
ෆැක්ස්: +94 11 2827109
විද්‍යුත් තැපෑල: info@lankamicrofinance.com
වෙබ් අඩවිය: www.microfinance.lk

මෙම පුවත් ප්‍රකාශනය සඳහා අනුග්‍රහය Plan